# කාර්යසාධන වාර්තාව

# 2015 நிருவாக அறிக்கை

# Performance Report



## ග්‍රාමීය ආර්ථීකය පිළිබඳ අමාත්‍යාංශය

## கிராமிய பொருளாதார அலுவல்கள் அமைச்சு

## Ministry of Rural Economic Affairs

# 2015 කාර්යසාධන වාර්තාව Performance Report

## ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
## Ministry of Rural Economic Affairs

# කාර්යසාධන වාර්තාව

# 2015

## ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය


නො. 27,
සතොස මහලේකම් කාර්යාලය,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
දුරකථන : 011-2300341-3
ෆැක්ස්: 011-2447669
විද්‍යුත් තැපැල: secretary@reco.gov.lk
වෙබ් අඩවිය: www.reco.gov.lk

# ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

## දැක්ම

තිරසාර ගැමි ආර්ථිකයක් තුළින් ඉසුරුමත් දැයක්

## මෙහෙවර

ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම උදෙසා ජීවනෝපාය සංවර්ධනය, දේශීය ඉල්ලුමට සරිලන පරිදි ඉහළ ගුණාත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය සහ දේශීය සහ අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දියහැකි අයුරින් සමෘද්ධිමත් දේශීය නිෂ්පාදකයින් බිහි කිරීම

## අමාත්‍යාංශයේ අරමුණු

- ග්‍රාමීය ජනතාව ආර්ථිකව නඟා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයකින් සමන්විත සත්ත්ව ගහනයක් ඇතිකරලීම සහ ආහාරයන්හි සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම හා සහය ලබා දීම
- නිරෝගිමත් සත්ත්ව ගහනයක් ඇතිකරලීම සඳහා ගුණාත්මක සත්ත්ව ආහාර ප්‍රචලිත කිරීම සහ සත්ත්ව රෝග වළක්වාලන හා මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම
- පශු සම්පත් මඟින් ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීම සඳහා ඉහළ ගුණාත්වයකින් යුත් සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම සහ දේශීය සත්ත්ව ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම

- ❖ පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කිරීම සඳහා අදාළ පාර්ශවයන් දිරි ගැන්වීම

- ❖ දේශීය කිරි ගොවීන් ශක්තිමත් කරමින් දියර කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමට දිරි දීම

- ❖ පූර්ණ බලැති ජාතික කෘෂිකර්ම අලෙවිකරණ අධිකාරිය ස්ථාපිත කිරීම තුළින් ප්‍රාදේශීය හා ගම් මට්ටමින් කෘෂි නිෂ්පාදන මිලට ගැනීම හා ගබඩා කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය සම්බන්ධීකරණය කිරීම

- ❖ තොග වෙළෙඳුන් හා පාරිභෝගිකයින්, කෘෂි නිෂ්පාදකයින් සමඟ සම්බන්ධ කිරීම තුළින් දේශීය කෘෂි නිෂ්පාදන මිල තිරසාර මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම



# පටුන


1. හැඳින්වීම..........8-9

2. කාර්යසාධන ප්‍රගතිය..........10-11

3. සංවිධාන ව්‍යුහය..........12

4. මානව සම්පත් කළමනාකරණය

4.1 කාර්ය මණ්ඩල සංයුතිය..........13-15

4.2 ස්ථාන මාරු වීම්..........16-21

4.3 පත්කිරීම්,උසස්වීම්, විනය කටයුතු හා විශ්‍රාම ගැනීම්..........21

4.4 බඳවා ගැනීමේ පරිපාටි සැකසීම..........22

4.5 ණය ලබාදීම..........22

4.6 මානව සම්පත් සංවර්ධනය

4.6.1 විදේශ පුහුණු..........23

5.වාහන

5.1 2015 වසර අවසානයේ අමාත්‍යාංශය සතුව පැවති වාහන..........24

5.2 වාහන මිලදී ගැනීම්, පැවරීම් හා අපහරණය..........25

6. නීති අංශය..........25

7. මූල්‍ය කළමනාකරණය

7.1 පුනරාවර්තන වියදම්..........26-27

7.2 ප්‍රාග්ධන වියදම්..........28-30

7.3 විගණන විමසුම්..........31

8. අභ්‍යන්තර විගණන අංශය..........31

9. 2015 වසර තුළ ඉටුකල සුවිශේෂී වැඩ සටහන්

9.1 දියර කිරි පරිභෝජනය  ප්‍රවර්ධනය හා  ප්‍රචලිත කිරීම............................................32

9.2 අභිජනන ගොවිපොළ ස්ථාපනය කිරීම................................................................33

9.3 පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන.....................................................35

9.4 කිරි ගවයින් ආනයනය..........................................................................................36

9.5 කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් ඇති කිරීම.....................................36

9.6 ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය නඟා සිටුවීම..........................................................37

9.7 මිල්කෝ කර්මාන්තශාලා නවීකරණය..................................................................38

9.8 නිපුණතා සංවර්ධන වැඩසටහන..........................................................................38

9.9 කිරි ගවයින් 20,000ක් ආනයනය.........................................................................39

9.10 කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.....................................39

9.11 වී මිලදී ගැනීමේ විශේෂිත වැඩ සටහන...............................................................39

9.12 විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලන ක්‍රමවේදයන් විධිමත් කිරීම................39

10. විශේෂ ජයග්‍රහණ

10.1 ප්‍රතිපත්තිමය සාධනයන්.........................................................................40

## 01. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයට පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි දක්වා ඇත.

මෙම අමාත්‍යාංශය කලින් පැවති ආහාර සුරක්ෂිතතාව අමාත්‍යාංශය, ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ සමාජ සේවා සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන් වල යම් යම් විෂයය කටයුතු එකතුවෙන් සැදුම් ලද්දකි.

- ❖ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ විෂයයට සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම,පසු විපරම් කිරීම හා ඇගයීම

- ❖ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- ❖ ප්‍රාදේශීය සහ ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සංවර්ධනය

- ❖ ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු

- ❖ ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය

- ❖ පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම

- ❖ සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු

- ❖ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම

- ❖ නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම

- ❖ පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු

අමාත්‍යාංශය වෙත පවරා ඇති මෙම කාර්යයන් ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- ග්‍රාමීය ජනතාව ආර්ථිකව නඟා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය කිරීම.

- ඉහළ ගුණත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය කිරීම තුළින් දේශීය ඉල්ලුම සපුරාලීම.

- පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කරලීම තුළින් වෙළෙඳපොළ විධිමත් කිරීම.

- කෘෂි නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය සම්බන්ධීකරණය කිරීම තුළින් දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දියහැකි දේශීය නිෂ්පාදකයින් බිහි කිරීම.

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටුකරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන ව්‍යුහයන් පහත පරිදි වේ.

1. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
3. සී/ස මිල්කෝ පුද්ගලික සමාගම
4. සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම
5. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම
6. වී අලෙවි මණ්ඩලය
7. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන
8. ග්‍රාමීය පුණර්ජීවන අරමුදල
9. ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල(මූල්‍ය)
10. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල)

## 02. කාර්යය සාධන ප්‍රගතිය

ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ ක්‍රමවේදයන්ට අනුගත වෙමින් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම, පශු සම්පත් නිෂ්පාදන වර්ධනය කිරීම තුලින් දේශීය ඉල්ලුම සපුරාලීම, පශු සම්පත් නිෂ්පාදන සඳහා අලෙවි ජාලයක් ඇති කිරීම, කෘෂි නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම නිෂ්පාදිත අලෙවිකරණය සම්බන්ධීකරණය තුලින් දේශීය හා අන්තර්ජාතික වෙළඳපොළ තුල ක්‍රියාත්මක කාර්යයන් ආශ්‍රයෙන් මෙම අමාත්‍යාංශ කාර්යයන් ක්‍රියාත්මක වන අතර මෙම ක්ෂේත්‍රයන්හි ප්‍රගමනයට අමාත්‍යාංශය මඟින් ලබා දිය යුතු දායකත්වය මෙම වසරේදී අඛණ්ඩව ලබා දී එම කටයුතු සාර්ථක කරගැනීමට හැකිවීම මෙම අමාත්‍යාංශය ලද ජයග්‍රහණයකි.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උප අංශයක් ලෙස ගැනෙන පශු සම්පත් ක්ෂේත්‍රය, ශ්‍රී ලාංකීය දළ ජාතික නිෂ්පාදිතය සඳහා වර්තමානයේදී සියයට එකක පමණ දායකත්වයක් දක්වයි. පශු සම්පත් ක්ෂේත්‍රයේ රැකියාවල නිරතවන සංඛ්‍යාව කෘෂි පවුල් මිලියනයක් පමණ වන අතර මින් බහුතරය ග්‍රාමීය පවුල්වේ. ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ වර්ධනයද සැලකිය යුතු දායකත්වයක් ලබාදේ. වඩාත් සෞඛ්‍යාරක්ෂිත සහ ගුණාත්මක ආකාරයෙන් සත්ත්ව නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා දිරිගැන්වීම සහ එමගින් පශු නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය සීමා කිරීම යන අරමුණු පෙරදැරිව ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක වේ.

මෙහිදී වෙළෙඳපොළ තුළ මිල සමතුලිතාව පවත්වා ගෙන යාම අරමුණු කර ගනිමින් ගොවීන් කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන කටයුතු සඳහා උනන්දු කරවීම ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම, රැකියා අවස්ථා ඇති කිරීම සහ සුභසාධනය ඇති කිරීම තුලින් මිනිස් පරිභෝජනය සඳහා අවශ්‍ය කරන සත්ත්ව මාංශ සහ බිත්තර ආදිය නිෂ්පාදනය කිරීම හා පැටවුන් අභිජනනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

තවද කුකුළු පාලන කර්මාන්තයේ සංවර්ධන සඳහා ඒ ආශ්‍රිත වෙනත් ව්‍යාපෘති හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම යොදා ගැනීම,කුකුළු ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය සම්පත් දායකයන් හා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන දේශීය හා විදේශීය වශයෙන් ලබාගැනීම,කුකුළු සංවර්ධන කර්මාන්තය දියුණු කිරීම සඳහා නිෂ්පාදකයන්, පාරිභෝගිකයන්, ගැණුම්කරුවන් හඳුනාගැනීම සහ එම කර්මාන්තයට අවශ්‍ය ආහාර, ඖෂධ වර්ග සම්බන්ධව කටයුතු සිදුකරන ආයතන සමඟ සම්බන්ධීකරණයන් සිදුකිරීම, රජයේ අභිජනන කුකුළු ගොවිපළවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, දිවයින පුරා විසිරී සිටින කුකුළු පාලනයට අදාළ ප්‍රජා මූල සංවිධාන ඒකරාශී කිරීම හා සවිබල ගැන්වීම, කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කිරීමද පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් මෙම අමාත්‍යාංශය යටතේ පිහිටි ආයතන මඟින් ඉටුකරන ලද සේවාවන්ය.

තවද පශු සම්පත් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් දීප ව්‍යාප්තව කිරි එකතු කිරීමේ ජාලයක්, කිරි සැකසුම් කර්මාන්ත ශාලා 4ක් සහ නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා දිවයින පුරා නියෝජිත ජාලයක් ස්ථාපිත කර ඇත.ගොවි සමිති 2200 ක් හා කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන 81ක් ඇති අතර මෙමඟින් දිවයිනේ මුළු කිරි නිෂ්පාදනයේ 30% පමණ එකතු කරනු ලබයි.

එමෙන්ම ගව සම්පත පිරිහීයාම වලක්වාලීම සහ කිරි නිෂ්පාදනය සහ බර ඇදීම යන කරුණු දෙකම අරමුණු කරගෙන උසස් ආකාරයේ ගවයන් සහ මී ගවයන් ඇති කිරීමේ සීඝ්‍ර වැඩසටහනකට අවධානය යොමු කර ඇත. පශු සම්පත හා පොල් වගාව ඒකාබද්ධව පවත්වාගෙන යාමට පශු සහ භෝග ඒකාබද්ධ ගොවිපොළවල් 31ක් වර්තමානයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන අතර, ගොවීන්ට න්‍යායික හා ප්‍රායෝගික දැනුම බෙදාදෙන පුහුණු මධ්‍යස්ථානයක්ද මණ්ඩලය සතුව ඇත.


වී මිලදී ගැනීමේ ජාතික වැඩසටහන මෙහෙයවීමත් මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රධාන විෂයය ක්ෂේත්‍රයකි. වී අලෙවි මණ්ඩලය 2007 වසරේ නැවත ආරම්භ කිරීමෙන් පසු රජයේ අපේක්ෂාව වූයේ වී නිෂ්පාදන කාර්යයේ නියුතු ගොවි මහතුන්ට තම ආර්ථික තත්ත්වය ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා සහතික මිල ක්‍රමයක් ඇති කිරීමත්, වී නිෂ්පාදන එම සහතික මිලට මිලදී ගැනීමත්, පාරිභෝගික ජනතාවට වඩාත් සාධාරණ මිලට සහල් වෙළෙඳපොළක් ඇති කිරීමත් ය. මේ යටතේ, වී අලෙවි මණ්ඩලය මඟින් වී මිලට ගැනීම, විකිණීම, සහල් බවට පත්කිරීම සහ සහල් සැපයීමේ හා බෙදාහැරීමේ කටයුතු ඉටු කරනු ලැබේ.

2014/15 මහ කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 802,213 ක් පමණ වූ අතර එමගින් අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො. මිලියන 2.66 කි. මෙම වී නිෂ්පාදනයෙන් වී අලෙවි මණ්ඩලය විසින් මෙ.ටො. 160,000 මිලදී ගැනීමට සැලසුම් කරන ලද අතර, 2014/15 මහ කන්නයේදී වී අලෙවි මණ්ඩලය සහ සමූපකාර සමිතිවලින් මිලදීගනු ලැබූ මුළු වී ප්‍රමාණය මෙ.ටො148,369.54 කි. 2015 යල කන්නයේදී වී වගා කල බිම් ප්‍රමාණය හෙක්ටයාර් 503,015 ක් පමණ වූ අතර, එමගින් අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො. මිලියන 1.93 කි. මෙම වී නිෂ්පාදනයෙන් වී අලෙවි මණ්ඩලය විසින් මෙ.ටො. 178,000 මිලදී ගැනීමට සැලසුම් කරන ලද අතර 2015 යල කන්නයේදී මිලදී ගත් මුළු වී ප්‍රමාණය මෙ.ටො. 175,266.73 කි. අදාල ප්‍රදේශවල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් සහතික කරන ලද තොරතුරු වාර්තාවන් සමඟ ගොවීන් විසින් සෘජුවම ගබඩාවලට වී ලබා දුන් අතර, වී අලෙවි මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති කි.ග්‍රෑ. 2000 ක් වූ උපරිම සීමාවක් යටතේ එක් ගොවියකුගෙන් වී මිලදී ගැනීම සිදුකර ඇත.

එමෙන්ම වී අලෙවි මණ්ඩලය විසින් 2015 යල කන්නයේ සිට නිල වෙබ් අඩවියක් ආරම්භ කර ඇති අතර එමඟින් වී අලෙවි මණ්ඩලය පිළිබඳ සාමාන්‍ය තොරතුරු වලට අමතරව දිවයින පුරා පිහිටි ගබඩාවන් වල වී මිලදී ගැනීමේ ප්‍රගතිය හා වී ලබා දුන් ගොවීන්ගේ තොරතුරු ක්ෂණිකව දැන ගැනීමට හැකිය. නිල වෙබ් අඩවිය www.pmb.gov.lk මඟින් අදාළ තොරතුරු ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් 1998 සිට රජයේ අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම ආරම්භ කර ඇත.

ඒ අනුව, වර්තමානයේ මෙම සියළුම ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා මෙහෙයවීම් කටයුතු මෙම අමාත්‍යාංශය යටතට පැවරී ඇත. දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. ඉදිරියේදී අම්පාර හා කිලිනොච්චි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට නියමිත ය.විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රධාන ප්‍රභේද තුනකින් සමන්විත වන අතර ඒවා කෘෂි නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් තොග මධ්‍යස්ථාන, කෘෂි නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග/ සිල්ලර වශයෙන් බෙදාහැරීමේ මධ්‍යස්ථාන, නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සිල්ලර අලෙවි මධ්‍යස්ථාන වශයෙන් බෙදී ඇත. මේ අනුව ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක වන මෙම අමාත්‍යාංශයේ කාර්යයභාරය 2015 වසර තුළ මනා මුලා කළමණාකාරීත්වයකින් යුතුව ඉටු කිරීමට හැකි වී ඇත.


ලේකම්
අතිරේක ලේකම් (පාලන හා මුදල්) (ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (පශු සම්පත්) (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) (ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පශු සම්පත් පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ස.නි.ස ෞ.සේ.) 03
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) 02
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ) 01
සහකාර ලේකම් (කම්කරු සබඳතා) 01
සහකාර ලේකම් (පාලන) 01
ගණකාධිකාරී (ප්‍රසම්පාදන) 01 (ශ්‍රී.ලං.ප.සේ.)
ගණකාධිකාරී (ගෙවීම්) 01 (ශ්‍රී.ලං.ප .සේ.)
සහකාර ලේකම් (පශු සම්පත් පාලන) 01(ශ්‍රී.ලං.ප.සේ.)
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ 04 පශු වෛද්‍ය 04 (ශ්‍රී.ලං.ස.නි.ස ෞ.සේ.)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්) (ශ්‍රී.ලං.ප.සේ.) 02
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) 03
නීති නිලධාරීස
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
පිළිගැනීමේ නිලධාරී
රියදුරු
කා.සේ.සේ
සංවර්ධන නිලධාරීස
කළමනා කරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනා කරණ සහකාර
කා.සේ.සේ
සං. නි. හා සමාන්තර සේවා
කළමනා කරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනාකරණ සහකාර
කා.සේ.සේ
සං. නි.හා සමාන්තර සේවා
කා.සේ.සේ
නීති සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරීස
කළමනා කරණ සහකාර
කා.සේ.සේ

# 04. මානව සම්පත් කළමනාකරණය

## 4.1 කාර්ය මණ්ඩල සංයුතිය

මෙම අමාත්‍යාංශය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 784 කි. 2015.12.31 දිනට ඉන් තනතුරු 773 ක නිලධාරීන් සේවයේ නිරතව සිටි අතර එදිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 11 කි.

**<u>ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය - අනුමත කාර්යය මණ්ඩලය</u>**

| අනු අංකය | තනතුර | සේවය | පන්තිය/ ශ්‍රේණිය | වැටුප් කේතය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2015.12 .31දිනට සිටින කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|
| 1. | ලේකම් | | | SL 4 - 2006 | 01 | 01 |
| 2. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL 3 - 2006 | 02 | 02 |
| 3. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ස.නි.සෞ. සේ. | විශේෂ | SL 3 - 2006 | 01 | 01 |
| 4. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 - 2006 | 02 | 02 |
| 5. | අධ්‍යක්‍ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 - 2006 | 02 | 01 |
| 6. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I | SL 1 - 2006 | 01 | 01 |
| 7. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. | I | SL 1 - 2006 | 01 | 01 |
| 8. | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | I | SL 1 - 2006 | 01 | 01 |
| 9. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ස.නි.සෞ. සේ. | I | SL 1 - 2006 | 03 | - |
| 10. | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | II/III | SL 1 - 2006 | 03 | 03 |
| 11. | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | II/III | SL 1 - 2006 | 02 | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12. | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ස.නි.සෞ. සේ. | II/III | SL 1 - 2006 | 04 | 04 |
| 13. | පශු වෛද්‍ය | ශ්‍රී.ලං.ස.නි.සෞ. සේ. | II/III | SL 1 - 2006 | 04 | 00 |
| 14. | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. | II/III | SL 1 - 2006 | 02 | 02 |
| 15. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | II/III | SL 1 - 2006 | 02 | 02 |
| 16. | නීති නිලධාරී | දෙපාර්තමේන්තු ගත | II/III | SL 1 - 2006 | 01 | 02 |
| 17. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | - | රු.22,250/- රා.පරි.ච.06/ 2006 (i) | 01 | 01 |
| 18. | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | අධි | MN 7– 2006A | 01 | 01 |
| 19. | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | I/ II | MN 6– 2006A | 02 | 01 |
| 20. | සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය | I /II/III | MN 4– 2006A | 606 | 601 |
| 21. | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4– 2006A | 42* | |
| 22. | වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4– 2006A | 08* | |
| 23. | මානව සම්පත් සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4– 2006A | 01* | 37 |
| 24. | විමර්ශන සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4– 2006A | 01* | |
| 25. | තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4– 2006A | 01* | |
| 26. | නීති සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4– 2006A | 01 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 27. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.හා සං.තා.සේ. | 3 පන්තිය I/II/III | MT 1–2006A | 01 | - |
| 28. | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | - | MT 1–2006A | 01 | 01 |
| 29. | වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | - | MT 1–2006A | 01 | 01 |
| 30. | රාජ්‍ය කළමණාකරණ සහකාර | රා.ක.ස.සේ. | I /II/III | MN 2–2006A | 32 | 32 |
| 31. | පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තු ගත | I /II/III | MN 1–2006A | 01# | 01 |
| 32. | රියදුරු | රියදුරු සේවය | විශේෂ I /II/III | PL 3–2006A | 30 | 37 |
| 33. | වීඩියෝ කැමරා සහයක | තාවකාලික | - | PL 1–2006A | 01 | 01 |
| 34. | කාර්යාල සේවක සේවයේ තනතුරු | කාර්යාල සේවක සේවය | විශේෂ I /II/III | PL 1–2006A | 20 | 33 |
| 35. | කාර්යාල කම්කරු | දෙපාර්තමේන්තු ගත | I /II/III | PL 1–2006A | 01# | 01 |
| | **එකතුව** | | | | **784** | **773** |

*ලකුණින් දක්වා ඇති තනතුරු, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට යටත්ව අනුමත තනතුරු වේ.

# ලකුණින් දක්වා ඇති තනතුරු, තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත තනතුරු වේ.

## 4.2 ස්ථාන මාරු වීම්

නිලධාරීන්ගේ ඉල්ලීම මත 2015 වර්ෂයේ සැප්තැම්බර් මස සිට නිලධාරීන් 58 ක් ස්ථාන මාරුවී ගොස් ඇති අතර ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් ගණන 02 කි.

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | |
|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | දිනය | රාජකාරී ස්ථානය |
| 1. | ඒ.එම්.කේ.කේ.අත්තනායක මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 2015.09.30 | සෞඛ්‍ය,පෝෂණසහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 2. | ඩී.එම්.එස්ඩී.ජයරත්න මිය<br>අතිරේක ලේකම්(පාලන) | 2015.10.23 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | | |
| 3. | කේ.එස්.මුරමුදලිගේ මිය<br>අධ්‍යක්ෂ (සැලසුම්) | 2015.10..23 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | | |
| 4. | එම්.සී.ගමගේ මයා<br>අධ්‍යක්ෂ (SME) | 2015.10.30 | විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | | |
| 5. | එන්.ජී.ටී.පෙරේරා මෙය<br>සහකාර අධ්‍යක්ෂ | 2015.11.30 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | | |
| 6. | එච්.පී.ඊ.එම්.තිසේරා මහතා<br>සහකාර අධ්‍යක්ෂ | 2015.11.04 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | | |
| 7. | එස්.එස්.එන්. ද සිල්වා මහතාඅතිරේක ලේකම් | 2015.11.23 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | | |
| 8. | එස්.ඒ.ඒ. ප්‍රියන්ති මිය<br>රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.11.09 | දුම්රිය දෙපාර්තමේන්තුව | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9. | එස්.එම්.එෆ්. සිල්වා මෙය<br>රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2015.11.18 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | |
| 10. | ටී.එස්.කේ. හෙට්ටිආරච්චි මිය<br>රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.11.23 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කළුතර | | |
| 11. | ටී.ඩී.එස්.කේ.පෙරේරා මයා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.11.30 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | | |
| 12. | ටී.නාලක ද සිල්වා මයා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.12.03 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 13. | එස්.කේ.කේ.එස්. දිල්රුක්ෂි මිය<br>රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.12.21 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | | |
| 14. | ඩබ්ලිව්.ඒ. ජනහිත මහතා<br>(ශ්‍රී.ලං.ප.සේ. III) | 2015.11.30 | දකුණු පළාත් සභාව | | |
| 15. | ජේ.පී. සමන්ති මිය<br>රා.ක.ස.සේ.I | 2015.09.22 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | | |
| 16. | එම්.ටී.එස්. කුමාරි මිය<br>රා.ක.ස.සේ.II | 2015.10.08 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | | |
| 17. | එම්.එච්.එස්.බේගම් මෙය.<br>රා.ක.ස.සේ.III | 2015.11.11 | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය | | |
| 18. | එච්.අයි. සජීවිකා මිය<br>රා. ක.ස.සේ.III | 2015.12.31 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | | |
| 19. | ආර්.එම්.එස්.රත්නායක මයා<br>රා.ක.ස.සේ.III | 2015.12.01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හෝමගම | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20. | එච්.ආර්.ජිනේන්ද්‍රරත්න මිය<br>රා.ක.ස.සේ.III | 2015.12.31 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කළුතර | | |
| 21. | එම්.ඒ.ඩී.සී.කුමාරි මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.02 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | | |
| 22. | එස්.පෙන්මුගප්‍රියන් මයා<br>කා.කා.ස. III | 2015.11.04 | ශ්‍රී පාද විද්‍යා පීඨය | | |
| 23. | නිශාන්ත වල්පිට මයා<br>රියදුරු III 'ආ' | 2015.11.09 | නීතිය, සාමය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | | |
| 24. | ඊ.ඩී.සි.ඩී.එදිරිසිංහ මිය<br>සංවර්ධන නිලධාරී | 2015.10.30 | අධ්‍යාපන අමාත්‍යාංශය | | |
| 25. | කේ.ටී.පී.කුමාර මයා<br>සංවර්ධන නිලධාරී | 2015.10.30 | විදේශ රැකියා අමාත්‍යාංශය | | |
| 26. | ඩබ්.එස්.යු.කුමාරි මිය<br>සංවර්ධන නිලධාරී | | | 2015.1 1.16 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ව |
| 27. | ඩී.ඒ.ඒ.පි.රණසිංහ මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.20 | අධ්‍යාපන අමාත්‍යාංශය | | |
| 28. | ආර්.කේ.එන්.එම්.කරව්දෙණි ය මිය - සංවර්ධන නිලධාරී | 2015.11.27 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය | | |
| 29. | එස්.එච්.එන්.එන්.කේ.ද සිල්වා මෙය - සංවර්ධන නිලධාරී | 2015.11.20 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය | | |
| 30. | ටී.ටී.ඩී.විජයවර්ධන මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.20 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය | | |
| 31. | ටී.ජී.එල්.පද්මිණි මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.16 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 32. | යූ.ඩබ්.ජී.ඩී.සී.ප්‍රියදර්ශනි මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.27 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 33. | ඩී.ඊ.පනාගොඩ මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.20 | අධ්‍යාපන අමාත්‍යාංශය | | |
| 34. | ආර්.එම්.අයි.සමිතා මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.20 | අධ්‍යාපන අමාත්‍යාංශය | | |
| 35. | ජේ.ඒ.බී.බී.එම්.ජයවික්‍රම මෙය<br>සංවර්ධන නිලධාරී | 2015.11.20 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 36. | බී.ඒ.සී.ගුණසිංහ<br>සංවර්ධන නිලධාරී | 2015.11.20 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 37. | බි.එස්.නසීමා මිය<br>සංවර්ධන නිලධාරී | 2015.11.30 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | | |
| 38. | කේ.මුරසිත් මෙහොමඩ් මයා<br>සංවර්ධන නිලධාරී | | | 2015.12.02 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 39. | ඊ.යූ.ඩී.බී.ජී.එන්.කේ. ඇහැලේපොළ මෙය<br>සංවර්ධන නිලධාරී | 2015.12.18 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | | |
| 40. | ඒ.එන්.එල්.ගුණවර්ධන මයා<br>සංවර්ධන සහකාර | 2015.10.02 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 41. | ඊ.එස්.අයි.සිල්වා මිය<br>සංවර්ධන සහකාර | 2015.10.23 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | | |
| 42. | ඊ.අයි.යූ.ප්‍රනාන්දු මිය<br>සංවර්ධන සහකාර | 2015.11.13 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | | |
| 43. | එම්.එස්.පි.සිල්වා මිය<br>සංවර්ධන සහකාර | 2015.11.18 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 44. | ඒ.එම්.ඩබ්.ඒකනායක මිය<br>සංවර්ධන සහකාර | 2015.11.24 | අධ්‍යාපන අමාත්‍යාංශය | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 45. | ජී.එන්.පෙරේරා මිය<br>සංවර්ධන සහකාර | 2015.11.27 | මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | | |
| 46. | ඩී.එම්.පී.දිසානායක මයා<br>සංවර්ධන සහකාර | 2015.11.30 | සෞඛ්‍ය අමාත්‍යාංශය | | |
| 47. | ඩී.කේ.පී.පෙරේරා මිය<br>සංවර්ධන සහකාර | 2015.12.16 | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | | |
| 48. | ජී.සී.වැලිකල මිය<br>නීති සහකාර | 2015.12.14 | අධිකරණ අමාත්‍යාංශය | | |
| 49. | වී.ඉමියවන් මයා<br>කා.කා.සේ III | 2015.10.30 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | | |
| 50. | බී.ජී.එම්.පි.කේ.රණසිංහ<br>කා.කා.සේ III | 2015.10.30 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පේරාදෙණිය | | |
| 51. | ආර්.ජී.ටී.චන්ද්‍රකාන්ත මයා<br>කා.කා.සේ I | 2015.11.30 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | | |
| 52. | ඩබ්.ජේ.එල්.බණ්ඩාර මයා<br>රියදුරු II ආ | 2015.09.22 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | | |
| 53. | පි.එච්.එම්.එම්.විජේසූරිය මයා<br>රියදුරු II ආ | 2015.09.22 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | | |
| 54. | ඩබ්.එම්.සී.පී.බණ්ඩාර මයා<br>රියදුරු II ආ | 2015.09.22 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | | |
| 55. | ඩබ්.ඒ.පී.බී.වික්‍රමසිංහ මයා<br>රියදුරු II ආ | 2015.10.08 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | | |
| 56. | ජේ.ඩී.පතිරණ මයා<br>රියදුරු II ආ | 2015.10.02 | සෞඛ්‍ය,පෝෂණ සහ දේශීය අමාත්‍යාංශය | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 57. | ඒ.පි.කඳුරුවාන මයා<br>කා.කා.සේ III | 2015.11.01 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය | | |
| 58. | එල්.ඒ.එම්.රණසිංහ මයා<br>කා.කා.සේ III | 2015.11.16 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | | |
| 59. | එස්.ඒ.සෙනෙවිරත්න මයා<br>කා.කා.සේ III | 2015.12.23 | ආගමන විගමන කටයුතු දෙපාර්තමේන්තුව | | |
| 60. | එච්.එල්.කේ.සෝමරත්න මයා<br>රියදුරු | 2015.10.05 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | | |

## 4.3 පත්කිරීම්, උසස්වීම්, විනය කටයුතු හා විශ්‍රාම ගැන්වීම්

2015 වර්ෂය තුළ අමාත්‍යාංශ නිලධාරීන්ගේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

| අනු අංකය | විස්තර | | නිමකල සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | බඳවා ගැනිම් | අමාත්‍යාංශයේ ස්ථිර කාර්යය මණ්ඩලය | නැත |
| | | ගරු අමාත්‍ය/නි.අමාත්‍ය කාර්යය මණ්ඩලය | 33 |
| | | තාවකාලික පත්කිරීම් | 03 |
| 02. | උසස් කිරීම් | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය - I ශ්‍රේණිය | 03 |
| | | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය - විශේෂ ශ්‍රේණිය | 01 |
| 03. | විශ්‍රාම ගැන්විම් | | 03 |

## 4.4 බඳවා ගැනීමේ පරිපාටි සැකසීම

### 4.4.1 අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු

අමාත්‍යාංශය, සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන ආයතන වල බඳවා ගැනිමේ පරිපාටි කටයුතු සියල්ල නිම කර ඇත.

### 4.4.2 සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල

| අනු අංකය | ආයතනය | කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 ට අනුව කාර්ය මණ්ඩල යාවත්කාලීන කිරීම | බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීම. ආරම්භ කල සංඛ්‍යාව | නිම කල සංඛ්‍යාව | ඉතිරිය |
|---|---|---|---|---|---|
| 01. | වි අලෙවි මණ්ඩලය | නිම කර ඇත | නිම කර ඇත | - | - |

## 4.5 ණය ලබාදීම

2015 වර්ෂය තුල අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබාදුන් ණය මුදල් වටිනාකම රුපියල් 627,435.00 කි. ආපදා ණය වශයෙන් මෙම ණය ලබාදී ඇත.

| අනු අංකය | ණය වර්ගය | 2015 | | |
|---|---|---|---|---|
| | | ඉල්ලීම් සංඛ්‍යාව | නිමකල සංඛ්‍යාව | වටිනාකම රුපියල් |
| 1. | ආපදා ණය | 11 | 11 | 627,435.00 |

## 4.6 මානව සම්පත් සංවර්ධනය

නිලධාරීන්ගේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති පුහුණු අවස්ථා

### 4.6.1 **විදේශ පුහුණු**

| අනු අංකය | නිලධාරියාගේ නම | පුහුණුවේ නම | තනතුර | කාලය | රට |
|---|---|---|---|---|---|
| 1. | පී. මායාදුන්නේ මයා | Building Food Security | අතිරේක ලේකම් | 2015..10.18-2015.10.24 | සිංගප්පූරුව |
| 2. | ඊ.එම්.එම්.ආර්.කේ. ඒකනායක මිය | ඊශ්‍රායල් හා ජෝර්දාන් සමූපකාර අධ්‍යාපන හා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | අතිරේක ලේකම් | 2015.09.18-2015.0924 | ඊශ්‍රායලය |
| 3. | ජේ.ඒ.එස්.ජයසිංහ මයා | Household Food Security For Nutrition Well-Being | අධ්‍යක්ෂ | 2015.11.01-2015.11.15 | තායිලන්තය |
| 4. | එම්.ජී.ඒ.එස්. ජයසේකර මිය | Development Policy | සංවර්ධන සහකාර | 2015.10.12-2015.11.01 | කොරියාව |
| 5. | ඊ.එම්.එස්.පී.බී. ඒකනායක මයා | Certificate in Co-operative Desktop Publishing | වැඩසටහන් සහකාර | 2015.10.14-2015.10.17 | මැලේසියාව |
| 6. | නිලුක්ෂි සමරසේකර මෙය | Strengthen Low income Families Trough Women in Rural Area | ගණකාධිකාරී | 2015.11.29-2015.12.12 | කොරියාව |
| 7. | වෛද්‍ය සී.එන්.එස්.ගමගේ මහතා | Rural Transformation programme for AARDO Member Countries | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015.10.04-2015.10.16 | මලයාසියාව |
| 8. | වෛද්‍ය සී.එන්.එස්.ගමගේ මහතා | International Training “programme for sufficiency Economy to wealthiness of the nation” | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015.11.02 – 2015.11.30 | තායිලන්තය |

# 05. වාහන

## 5.1 2015 වසර අවසානයේ අමාත්‍යාංශය සතුව පැවති වාහන

| | ජීප් රථ | කාර් රථ | කැබ් රථ | ඩිෆෙන්ඩර් ජීප් රථ | වෑන් රථ | යතුරුපැදි |
|---|---|---|---|---|---|---|
| 01. | CAA -0024 | KY-4046 | PD-2955 | CAH-1634 | NB-3395 | XU -7010 |
| 02. | KW -9982 | KO-5114 | PF-6980 | | 251-0747 | BBT-5614 |
| 03. | KQ -8444 | KQ-9375 | PE-0010 | | | TT -2974 |
| 04. | KT -8467 | KX-8612 | PF-5883 | | | |
| 05. | KQ -5408 | KQ-7500 | PF-5884 | | | |
| 06. | KX -8135 | KX-7037 | PG-4008 | | | |
| 07. | GF -9288 | KX-7935 | PG-2659 | | | |
| 08. | KX -8136 | KX-7664 | JY-2948 | | | |
| 09. | CAB -6799 | KQ-6416 | PA-1440 | | | |
| 10. | KO -0024 | KO-4865 | PA-1438 | | | |
| 11. | 64 -3179 | KB-8264 | PF-6976 | | | |
| 12. | 65 -0881 | KD-0743 | PD-8931 | | | |
| 13. | 65 -4043 | KD-0737 | 252-9655 | | | |
| 14. | KY -5292 | JO-6958 | PG - 1773 | | | |
| 15. | CAF - 4619 | KP-4164 | PF - 8209 | | | |
| | 15 | 15 | 15 | 01 | 02 | 03 |

2015 වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශය සතුව භාවිතයේ පැවති වාහන ගණන 51 වන අතර, ධාවනවෙන් ඉවත්කර ඇති වාහන ගණන 27 කි. අමාත්‍යාංශය මඟින් වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන ගණන 47 ක් වන අතර වෙනත් ආයතන මඟින් ලබාගෙන ඇති වාහන ගණන 29 කි. අපහරණය කිරීමට යෝජිත වාහන ගණන 18 කි.

## 5.2 වාහන මිලදී ගැනීම්, පැවරීම්, සහ අපහරණය

| අනු අංකය | වාහන වර්ගය | ආරම්භයේ පැවති වාහන | වර්ෂය තුල සිදුවන ලද වෙනස්වීම් | | | | | අවසාන යේ පැවති තත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මිලදී ගැනීම් | මූල්‍ය කල්බදු ක්‍රමයෙන් ලද වාහන | පවරාදීම | පවරා ගැනීම් | වාහන අපහරණය | |
| 1. | ජීප් රථ | 15 | - | - | - | - | - | 15 |
| 2. | කාර් රථ | 15 | - | - | - | - | - | 15 |
| 3. | කැබ් රථ | 15 | - | - | - | - | - | 15 |
| 4. | ඩිෆෙන්ඩර් රථ | 01 | - | - | - | - | - | 01 |
| 5. | වෑන් රථ | 02 | - | - | - | - | - | 02 |
| 6. | යතුරු පැදි | 03 | - | - | - | - | - | 03 |
| | | 51 | - | - | - | - | - | 51 |

# 06. නීති අංශය

නඩු කටයුතු පිළිබඳ තොරතුරු

2015 වර්ෂයේ කාර්ය සටහන

| අධිකරණය | ආරම්භයේ ඉතිරිව පැවති නඩු | 2015 වර්ෂයේ තුල ආරම්භ කල නඩු | නිම කල සංඛ්‍යාව | 2015.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ | 01 | - | - | 01 |
| අභියාචනා | 01 | - | - | 01 |
| මහාධිකරණ | 01 | - | - | 01 |
| දිසාධිකරණ | 12 | 01 | 05 | 08 |
| මානව හිමිකම් | 01 | - | - | 01 |
| කම්කරු විනිශ්වය සභා | 03 | - | - | 03 |

# 07. මූල්‍ය කළමනාකරණය

## 7.1 පුනරාවර්තන වියදම්

| වැඩසටහන | ව්‍යාපෘතිය | උපව්‍යාපෘතිය | වැය විෂය විස්තරය | මූල්‍යකරණය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2015 රු. | 2015.12.31 දිනට වියදම රු. |
|---|---|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | | | | | | |
| 1 | 1 | | අමාත්‍ය කාර්යාලය | 11 | 6,800,000.00 | 4,326,604.03 |
| 1 | 2 | | පරිපාලන හා ආයතන සේවා | 11 | 74,234,675.00 | 45,218,934.07 |
| 2 | 5 | | පශු සම්පත් සංවර්ධනය | 11 | 47,700,000.00 | 34,915,678.03 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | | | 11 | | |
| 1 | 1 | 0 | අමාත්‍ය කාර්යාලය | 11 | 7,963,017.00 | 4,533,535.07 |
| 1 | 2 | 0 | පරිපාලන හා ආයතන සේවා | 11 | 7,505,219,204.00 | 7,501,434,860.00 |
| 2 | 5 | 0 | පශු සම්පත් සංවර්ධනය | 11 | 1,000,000.00 | 460,836.52 |
| රාජ්‍ය ආයතන හා නියෝජිත ආයතන | | | | 11 | | |
| 2 | 4 | 1 | වී අලෙවි මණ්ඩලය | 11 | 110,500,000.00 | 70,260,500.00 |
| 2 | 5 | 2 | මිල්කෝ ආයතනය | 11 | 35,000,000.00 | 35,000,000.00 |
| මුලු එකතුව | | | | | 7,788,416,896.00 | **7,696,150,947.72** |

වියාපෘතිය : 02 - පරිපාලන හා ආයතනික සේවා

| වැය ශීර්ෂ අංකය | වැය විෂය විස්තරය | මූලාශ්‍රය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2015 රු. | 2015 .12.31 දිනට වියදම රු. |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශ පරිපාලන කටයුතු | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 11 | 500,000.00 | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 11 | 130,000.00 | - |
| 2003 | වාහන | 11 | 790,194.00 | 790,193.15 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 11 | 584,931.00 | 584,930.75 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 11 | 375,000.00 | - |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 11 | 650,000.00 | 373,092.40 |
| | **මුලු එකතුව** | | **3,030,125.00** | **1,748,216.30** |

## 7.2 ප්‍රාග්ධන වියදම්

වැඩසටහන් : 01 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘතිය : 01 - අමාත්‍ය කාර්යාලය

| වැය විෂය අංකය | වැය විෂය විස්තරය | මුල්‍යකරණය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2015 රු. | 2015.12.31 දිනට වියදම් රු. |
|---|---|---|---|---|
| | මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 11 | 500,000.00 | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 11 | 200,000.00 | 4,500.00 |
| 2003 | වාහන | | 2,300,000.00 | 444,746.65 |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 11 | 1,000,000.00 | 216,700.00 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 11 | 1,000,000.00 | 119,585.27 |
| | මුලු එකතුව | | 5,000,000.00 | 785,531.92 |

වැඩසටහන : 02- සංවර්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතිය : 03 - සංවර්ධන ව්‍යාපෘති

| උප ව්‍යාපෘතිය | වැය විෂය අංකය | වැය විෂය විස්තරය | මූලාශ්‍රය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2015 රු | 2015.12.31 දිනට වියදම රු. |
|---|---|---|---|---|---|
| 1 | 2502 | ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම | 11 | 125,000,000.00 | 95,738,749.19 |
| 2 | 2502 | ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 12 | 1,404,000,000.00 | 151,302,831.28 |
| | | ” | 17 | 107,900,000.00 | 1,796,505.15 |
| 3 | 2502 | සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම | | 31,000,000.00 | 170,038.00 |
| | | ” | | | |
| 4 | 2502 | මැටි කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම | | 10,000,000.00 | 258,174.00 |
| 5 | 2502 | හස්ත කර්මාන්ත ගම්මාන වැඩදියුණු කිරීම | | 5,000,000.00 | - |
| 6 | 2502 | හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මාන ස්ථාපිත කිරීම | 13 | 24,000,000.00 | - |
| | | ” | 17 | 4,000,000.00 | 384,000.00 |
| 7 | 2502 | කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්කවල අපනයනය සඳහා කෘෂිකර්මාන්තය හා කිරිපිටි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම තුලින් ග්‍රාමීය සංවර්ධනය ඇති කර ගැනීම | 12 | 50,000,000.00 | - |
| | | ” | 17 | 113,820,000.00 | - |
| 8 | 2502 | කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය | | 28,000,000.00 | 8,698,810.81 |
| | මුළු එකතුව | | | **1,902,720,000.00** | **258,349,108.43** |

වැඩසටහන : 02 - සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය : 04 - සංවර්ධන

ව්‍යාපෘති

රාජ්‍ය ආයතන

| ව්‍යාපෘතිය අංක | වැය විෂය අංකය | වැය විස්තරය | මූලාශ්‍රය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2015 රු. | 2015.12.31 දිනට වියදම රු. |
|---|---|---|---|---|---|
| 1 | 2201 | පවත්නා ගබඩා සහ වී මෝල් ධාරිතාව වැඩිදියුණු කිරීම | 11 | 175,000,000.00 | 155,000,000.00 |

වැඩසටහන:02 - සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය : 05- පශු සම්පත් සංවර්ධනය

| ව්‍යාපෘති අංක | වැය විෂය අංකය | වැය විස්තරය | මූලාශ්‍රය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2015 රු. | 2015.12.31 දිනට වියදම රු. |
|---|---|---|---|---|---|
| 3 | 2502 | දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම | 11 | 50,000,000.00 | 46,365,660.45 |
| 4 | 2502 | සතුන් අභිජනනය කිරීමේ ගොවිපල ස්ථාපනය කිරීම | 11 | 35,000,000.00 | 33,859,996.91 |
| 14 | 2502 | මධ්‍ය කාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන | 11 | 50,000,000.00 | 24,397,451.40 |
| 15 | 2502 | කිරිගවයින් ආනයනය කිරීම | 12 | 2,000,000,000.00 | 2,000,000,000.00 |
| | | ,, | 17 | 388,900,000.00 | 360,350,377.46 |
| 19 | 2502 | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | | 20,000,000.00 | 17,678,081.01 |
| 23 | 2502 | සූකර කර්මාන්තය සංවර්ධනය කිරීම | | 15,000,000.00 | 14,085,755.55 |
| 24 | 2302 | මිල්කෝ ආයතනය සැකසුම් කර්මාන්ත ශාලා නවීකරණය කිරීම | 12 | 2,250,000,000.00 | 1,322,737,023.00 |
| | | ,, | 17 | 280,000,000.00 | - |
| 27 | 2502 | කිරිගවයින් 20000 ක් පිටරටින් ආනයනය කිරීම | 12 | 3,000,000,000.00 | - |
| | | ,, | 17 | 1,000,000.00 | - |
| 28 | 2502 | කිරිපට්ටි 12 ක් ගොඩනැගීම සඳහා | 12 | 400,000,000.00 | - |
| | | ,, | 17 | 100,000.00 | - |
| | මුළු එකතුව | | | 8,490,000,000.00 | 3,819,474,345.78 |

### 7.3 විගණන විමසුම්

2015 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් වූ විගණන විමසුම් සංඛ්‍යාව 27කි. 2015 වර්ෂය තුල පිළිතුරු සැපයූ සංඛ්‍යාව 21 ක් වන අතර 2015.12.31 දිනට පිළිතුරු සැපයීමට ඉතිරිව පැවති විගණන විමසුම් සංඛ්‍යාව 06 කි.

## 08. අභ්‍යන්තර විගණන අංශය

2015 වර්ෂය තුළ නිම කළ කාර්යයන්

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර ඇති අතර, ඉන් පහත සඳහන් කරුණු 2015 වර්ෂය තුළ ඉටු කර ඇත.

- 2015 වර්ෂයේ පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගණන 03 කි.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි වාර්ෂික ප්‍රගතිය ආවරණ වන පරිදි සියලු ආයතන වල කාර්යයන් විගණනයට ලක්කර ඉදිරිපත් කර ඇති වාර්තා ගණන 08 කි.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි කරුණු සම්බන්ධයෙන් සිදුකරණ විමර්ශන ගණන 14 කි.

# 09. 2015 වසර තුළ ඉටුකල සුවිශේෂී වැඩ සටහන්

## 9.1 දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම

2015 වර්ෂයේදී නවමු මුහුණුවරකින් ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වැඩසටහන් හතරක් යටතේ ක්‍රියාත්මක වේ.

### 9.1.1. සෞඛ්‍යාරක්ෂිතව කිරි එකතු කිරීම දිරිගැන්වීම සඳහා ගොවීන් වෙත කිරි කෑන් ලබා දීම

දිවයින පුරා තෝරාගත් කිරි ගොවීන් සඳහා නිසි ප්‍රමිතියෙන් යුතු කිරි කෑන් ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලබන අතර, දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 10 හෝ ඊට වැඩි හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගොවිපොළවල් මේ සඳහා තෝරා ගනු ලැබේ.

මෙම වැඩසටහන පශු සම්පත් සංවර්ධන අංශයේ ප්‍රතිපාදන යටතේ මිල්කෝ (පුද්ගලික) සමාගම හරහා සිදු කෙරෙන අතර, ගොවීන් 975 දෙනෙකු වෙත ලීටර් දහයක ධාරිතාවයකින් යුතු කිරි කෑන් බෙදා දී ඇත. මේ සඳහා රුපියල් මිලියන 3.1ක මුදලක් ආයෝජනය කර ඇත.





*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු අමාත්‍යතුමන් කිරි ගොවීන් වෙත කිරි කෑන් ලබාදීමේ අවස්ථාවක්*

### 9.1.2. දියර කිරි භාවිතය සහ දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් පාසැල් සිසුන් සඳහා දීපව්‍යාප්ත නිර්මාණ තරඟාවලියක් සංවිධානය කිරීම

පාසැල් සිසුන් අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ අරමුණින් පශු සම්පත් සංවර්ධන අංශය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ජාතික වැඩසටහනක් ලෙස දීපව්‍යාප්තව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල රුපියල් මිලියන 5කි. "දියර කිරි පරිභෝජනය"යන තේමාව යටතේ රචනා, කාව්‍ය නිර්මාණ, රූපවාහිනී අත් පිටපත්, දියර කිරි නිෂ්පාදනය පිළිබඳ ලාංඡන සහ චිත්‍ර නිර්මාණ තරඟ සංවිධානය කර ඇත. අදාළ චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසැල් වෙත නිකුත් කර ඇති අතර, මේ වනවිට අදාළ නිර්මාණ ලැබී තිබේ.

#### 9.1.3. දීප ව්‍යාප්ත කිරි එකතු කිරීමේ ජාලය සවිබල ගැන්වීම

සී/ස මිල්කෝ පුද්ගලික සමාගම යටතේ ක්‍රියාත්මක දීපව්‍යාප්ත කිරි එකතු කිරීමේ හා කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර, මිල්කෝ ආයතනයේ ඉල්ලීමට අනුව, කුඩා පරිමාණ කිරි ශීතාගාර,කිරි එකතු කිරීමේ ටැංකි සහ කිරි ශීත කිරීමේ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

### 9.2. අභිජනන ගොවිපොළ පිහිටුවීමේ ව්‍යාපෘතිය

#### 9.2.1. අභිජනන ගොවිපොළ පිහිටුවීම

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීමේ අරමුණ ඇතිව දිවයින පුරා අභිජනන ගොවිපොළවල් පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2015 වසර තුළ සත්ත්ව අභිජනන ගොවිපොළ 252 ක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, එමගින් අභිජනනය සඳහා සුදුසු සතුන් මිලදී ගැනීම සහ ගවගාල් සාදා ගැනීමටත් සියයට 50 ක පදනම යටතේ සහනාධාර ලබාදීම සිදු කෙරේ.





*අභිජනන ගොවිපොළවල් පිහිටුවීම යටතේ වැඩිදියුණු කළ ගවගාල් සහ ලබාදුන් උසස් ආරයේ දෙනුන්*

***2015 වසර තුළ ක්‍රියාත්මක අභිජනන ගොවිපොළ සංඛ්‍යාව***

| *පළාත* | *අභිජනන ගොවිපොළ* | |
|---|---|---|
| | *ඉලක්කය* | *අනුමත කරන ලද සංඛ්‍යාව* |
| *මධ්‍යම* | *45* | *42* |
| *නැගෙනහිර* | *20* | *19* |
| *උතුර* | *40* | *40* |
| *උතුරු මැද* | *20* | *18* |
| *වයඹ* | *50* | *50* |
| *සබරගමුව* | *16* | *16* |
| *දකුණ* | *15* | *15* |
| *ඌව* | *34* | *32* |
| *බස්නාහිර* | *20* | *20* |
| ***එකතුව*** | ***260*** | ***252*** |

### 9.2.2 මධ්‍ය පරිමාණ අභිජනන ගොවිපොළ පිහිටුවීම

තෝරාගත් ගොවිපොළක වැස්සි පැටවුන් 50 ක් එකවර ඇති කර ගැබ් ගන්වා කිරි ගොවීන් අතර බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන අතර එවැනි ගොවිපොළක් පවත්වාගෙන යන ආයතනයකට හෝ පුද්ගලයෙකුට එම සතුන් සඳහා ගාල් සාදා ගැනීම වැනි යටිතල පහසුකම් වැඩි දියුණු කර ගැනීමට මෙම ව්‍යාපෘතිය මගින් සහනාධාර ලබාදේ. සමාලෝචිත කාලසීමාව තුළදී එවැනි එක් ගොවිපොළක් පිහිටුවීමට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුමත කර ඇත.

### 9.2.3. කුඩා පරිමාණ කිරි ගොවීන් දිරි ගැන්වීම

කිරි ගවයින් ඇති කිරීමට උනන්දුව හා හැකියාව ඇති, ක්ෂේත්‍රයට අළුතින් එක් වන ගොවි මහතුන් මෙන්ම දැනට කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයන්ගේ ආදායම් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා, වටිනාකමින් සියයට 50 ක දායකත්වය යටතේ දෙනුන් හෝ වැස්සියන් ලබා දීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම වසරේ ඉලක්කගත ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 200කි. මෙම ව්‍යාපෘතිය සඳහා උතුරු මැද හා වයඹ පළාත්වලින් ප්‍රතිලාභීන් තෝරාගෙන ඇත.

*අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2015 සැප්. 30 දිනට)*

| පළාත | අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| --- | --- |
| උතුරු මැද | 91 |
| වයඹ | 23 |
| එකතුව | **114** |

### 9.3 පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන.

උතුරු පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව 2015 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- ❖ කිලිනොච්චි සත්ත්ව පාලන පුහුණු පාසලෙහි පිරිමි නේවාසිකාගාරය ඉදි කිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදී ඇති අතර මූලික කටයුතු සිදුවෙමින් පවතී
- ❖ කරෙයිනගර් පශු වෛද්‍ය කාර්යාලය හා නිල නිවස ඉදි කිරීමේ කටයුතු නිමවා ඇත
- ❖ වැලිඔය පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන ලබාදී ඇති අතර දැනට ඉදිකිරීම් සිදු වෙමින් පවතී
- ❖ කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පලෙයි පශු වෛද්‍ය නිල නිවස ඉදි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාත් අධ්‍යක්ෂ වෙත වෙන් කර දී ඇති අතර මූලික කටයුතු සිදු වෙමින් පවතී
- ❖ උතුරු පළාතේ පශු වෛද්‍ය කාර්යාල සහ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන සඳහා රුපියල් මිලියන 5ක වටිනාකමින් යුතු පරිගණක උපාංග, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා කාර්යාල උපකරණ සැපයීමට ප්‍රතිපාදන වෙන්කර දී ඇති අතර පළාත් අධ්‍යක්ෂ විසින් අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.



*කිලිනොච්චි සත්ත්ව පාලන පුහුණු පාසැලේ ඉදිකෙරෙමින් පවතින පිරිමි නේවාසිකාගාරය*



*කරෙයිනගර් පශු වෛද්‍ය කාර්යාලය සහ නිල නිවාස සංකීර්ණය*

### 9.4 කිරි ගවයින් ආනයන ව්‍යාපෘතිය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි ගව අභිජනන සංචිතය දියුණු කිරීම සහ උසස් ආරයේ කිරි ගවයින් ගොවීන් වෙත සපයාදීම අරමුණු කරගෙන කිරි ගවයින් 4,500ක් කණ්ඩායම් ලෙස ආනයනය කිරීමට කටයුතු කර ඇත. 2012 සහ 2013 වර්ෂ වලදී ගැබ් ගත් දෙනුන් 2,000 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් බෝපත්තලාව, මැණික්පාලම හා ඩයගම යන ගොවිපොළවල් සඳහා ආනයනය කර ඇත. ආනයනය කළ එළදෙනුන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත් සත්ත්ව අපද්‍රව්‍ය පහසුවෙන් ඉවත් කිරීමටත් පහසුවන පරිදි සාම්ප්‍රදායික ගවගාල් නවීකරණය කරන ලදී.

2015 වර්ෂයේදී කිරි ගවයින් 1,183ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් රිදියගම ගොවිපොළ වෙත ආනයනය කර ඇති අතර, එම සතුන් සඳහා අවශ්‍ය කෘත්‍රිම පාරිසරික තත්ත්ව වලින් සහ කාර්යක්ෂම සත්ත්ව අපද්‍රව්‍ය ඉවත් කරන ක්‍රම වලින් සමන්විතව නවීන ගවගාල් ඉදි කර ඇත. ඉතිරි ගවයන් 1,317 සමාලෝචිත වසරේ ඔක්තෝබර් මසදී ආනයනය කිරීමට නියමිතය.

ආනයනික දෙනුන්ගේ දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 23,000 සිට 25,000 දක්වා වන අතර පැටවුන් බිහි කිරීම ආරම්භ කර ඇති එක් දෙනකගේ සාමාන්‍ය දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 19 ක් දක්වා වර්ධනය වී ඇත. ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් ගොවිපොළවල මේ දක්වා වාර්තා වූ ඉහළම කිරි නිෂ්පාදන අගය ලෙස මෙය දැක්විය හැකි අතර, කිරි ලීටරයක විකුණුම් මිල රුපියල් 85 කි. 2015 සැප්තැම්බර් මස අවසන් වනවිට ආනයනික කිරි දෙනුන්ගෙන් බිහිවූ උසස් ආරයේ වැස්සි පැටවුන් 455ක් හා වසු පැටවුන් 508ක් ඇතුළුව සමස්ත වැස්සි පැටවුන් 804 ක් සහ වසු පැටවුන් 2,763 ක් ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් ගොවිපොළ මගින් ගොවීන් වෙත නිකුත් කර ඇත. තවද, ඉදිරි පරම්පරාව සඳහා ගැහැණු සතුන් 365ක් බෝපත්තලාව, මැණික්පාලම සහ ඩයගම ගොවිපොළවල ඇතිදැඩි කරනු ලැබේ.



***ජා.ප.සං. මණ්ඩලයේ රිදියගම ගොවිපළ තුළ ඉදිකර ඇති පාලිත පරිසර තත්වයන් සහිත නව ගවගාල්***



***රිදියගම ගොවිපොළ වෙත ආනයනික කිරිදෙනුන් හම්බන්තොට වරායෙන් ගොඩබෑමේ අවස්ථාව***

### 9.5 කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

කුකුළු නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කර අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් කටයුතු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ යටතේ නව ව්‍යවසායකයින් කුකුළු පාලන

ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමත්, දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් සිදු කරන අතර බිත්තර, කුකුළු මස් හා සත්ත්ව ආහාර නිෂ්පාදනය මෙන්ම කුකුළු පැටවුන් නිෂ්පාදනය ප්‍රචලිත කිරීමත් අපේක්ෂා කෙරේ.

සෑම පුද්ගලයෙකුටම සතියකට බිත්තර 3ක් සහ වසරකට කුකුළු මස් කිලෝ ග්‍රෑම් 10ක් පරිභෝජනය කිරීමට හැකිවන පරිදි කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. 2015 තෙවන කාර්තුව අවසන් වනවිට කුඩා පරිමාණ ගොවිපොළ 2,788ක් පිහිටුවීමට අදාළ කටයුතු සිදු කර ඇත. මීට අමතරව, කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර 18 ක්, කුඩා පරිමාණ මස් සකස් කිරීමේ මධ්‍යස්ථාන 29 ක් සහ බිත්තර රක්නාගාර 04 ක් ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතී.



*මසක් වයසැති කුකුළු පැටවුන් උතුරු පළාත තුළ බෙදාදීමේ අවස්ථාවක්*



*සංවර්ධිත සුළු පරිමාණ කුකුළු ගොවිපොළක්*

### 9.6 සූකර සංවර්ධන වැඩසටහන

පශු සම්පත් යටතට ගැනෙන ක්ෂීරපායී සතුන් අතුරින් සූකරයින් ඉතා ඉක්මනින් බෝවන මාංශ නිෂ්පාදකයින් වන අතර ඔවුන් ඕනෑම මස් ආශ්‍රිත කර්මාන්තයක් සඳහා භාවිත කළ හැකි ආහාර පරිවර්තකයින් වේ. ශ්‍රී ලංකාවේ සූකර ගොවීන් වඩාත් පැතිරී සිටිනුයේ මුහුදු තීරය දිගේ වන අතර මුළු සූකර ගහනය 85,000 ක් පමණවේ. සූකර කර්මාන්තය වඩාත් ලාභදායී හා ඵලදායී කර්මාන්තයක් ද වේ.

සූකර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන පරිසර දූෂණය සම්බන්ධව සිදු කෙරෙන මහජන පැමිණිලි සංඛ්‍යාව ඉහළ යාම හා රට තුළ පවතින න්‍යෂ්ටික සූකර පට්ටි අතර සිදුවන අභ්‍යන්තර අභිජනනය හේතුවෙන් උසස් තත්ත්වයේ සතුන් ලබා ගැනීම දුෂ්කර වීම නිසා සූකර කර්මාන්තයේ ලාභදායීතාවය හා ඵලදායීතාවය අඩු වී ඇත.

සූකර කර්මාන්තයේ නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් හොරකැලේ ගොවිපොළෙහි න්‍යෂ්ටික සූකර පට්ටියක් ස්ථාපිත කිරීම සඳහා නුමුහුන් ඊරියන් සහ ඌරන් ආනයනය කිරීම, බස්නාහිර පළාත් කොටදෙනියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ

පවත්වාගෙන යනු ලබන කෘත්‍රිම සිංචන කටයුතු ව්‍යාප්ත කිරීම හා පවත්නා ගොවිපොළ පරිසර හිතකාමී තත්ත්වයට නඟා සිටුවීමත් අපේක්ෂා කෙරේ. තවද මෙම වැඩසටහන යටතේ, බස්නාහිර හා වයඹ පළාත් තුළ දැනට පවතින කුඩා පරිමාණ සූකර ගොවිපොළ 90 ක් පරිසර හිතකාමී තත්ත්වයට නඟා සිටුවීම,

කොටදෙණියාව සත්ත්ව ගොවිපොළෙහි ආරම්භ කරන ලද ආදර්ශ සූකර ගොවිපොළෙහි සංවර්ධන කටයුතු සිදු කිරීම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හොරකැළේ න්‍යෂ්ටික සූකර ගොවිපොළ නවීකරණය කිරීම වෙනුවෙන් නවීන පන්නයේ සූකර නිවාස ඉදි කිරීමත් අපේක්ෂිතය.



*ජා.ප.සං. මණ්ඩලයට අයත් නවීකරණය කරන ලද හොරකැළේ සූකර අභිජනන ගොවිපොළ වෙත ආනයනික සතුන් ලබාදීමේ අවස්ථාවක්*

### 9.7 මිල්කෝ කර්මාන්තශාලා නවීකරණය කිරීම

මිල්කෝ (පුද්ගලික) සමාගම සතු දිගන, පොළොන්නරුව සහ අඹේවෙල කර්මාන්ත ශාලාවල නිෂ්පාදන ධාරිතාව දිනකට ලීටර 400,000 දක්වා ඉහළ නැංවීමේ අරමුණින් 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයට රුපියල් මිලියන 2,530 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. සමාලෝචිත කාලසීමාව අවසානය වනවිට පොළොන්නරුව කර්මාන්තශාලාවෙහි යන්ත්‍රෝපකරණ සහ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම නවීකරණය කොට මිල්කෝ සමාගම වෙත භාර දී ඇති අතර, දිගන කර්මාන්තශාලාවෙහි නවීකරණ කටයුතුවලින් සියයට 95ක් ද,අඹේවෙල කර්මාන්තශාලාවෙන් සියයට 70 ක්ද සම්පූර්ණ කොට ඇත. මේ දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් යූරෝ මිලියන 33.2 ක වටිනාකමින් යුතු භාණ්ඩ ආනයනය කර ඇත.

### 9.8 නිපුණතා සංවර්ධන වැඩසටහන

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් සීප්පුකුළම හා කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම සහ අදාළ නිපුණතා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 60 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2015 වර්ෂයේ තෙවන කාර්තුව අවසන් වන විට මෙම ව්‍යාපෘතියෙන් අත්කරගත් ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

- කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ සිසු නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය, රසායනාගාරය නවීකරණය සහ කම්කරු නිවාස ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත

- සීප්පුකුළම සත්ත්ව පාලන විද්‍යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ල, සේවාස්ථ මධ්‍යස්ථාන නිල නිවාස සහ කම්කරු නිවාසවල නවීකරණ කටයුතු සිදු කරමින් පවතී

### 9.9 කිරි ගවයින් 20,000 ක් ආනයනය කිරීම

මෙම ව්‍යාපෘතිය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ව්‍යාපෘතියක් වන අතර, නව අමාත්‍යාංශ බෙදීමේදී අප අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් උසස් ආරයේ ගැබ්බර කිරි දෙනුන් 20,000 ක් ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. කිරි ගව පාලනයේ නිරතවන මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසායකයින් වෙත මෙම එළදෙනුන් ලබා දී වඩා කාර්යක්ෂම හා ගුණාත්මක කිරි නිෂ්පාදනයක් ඇති ගොවිපොළවල් දීපව්‍යාප්තව පිහිටුවීමට අපේක්ෂිතය. මෙම සතුන්ගෙන් ජනිතවන සතුන් නිෂ්පාදන කටයුතුවලට යොදවා ගැනීමට සහ දේශීය ආරයන් වැඩිදියුණු කරගැනීමට දායක කර ගැනීමටද අපේක්ෂිතය.

එහිදී මෙම ව්‍යාපෘතිය පිළිබඳ සමාලෝචන කමිටුවක් පත්කර, එහි නිර්දේශ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආර්ථික කටයුතු පිළිබඳ අනු කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව අනුමැතිය ලැබී ඇතත් භාණ්ඩාගාරය මගින් අදාළ පාර්ශවයන් සමඟ මේ වනතෙක් ගිවිසුම් අත්සන් කර නොමැත.

### 9.10 කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර ස්ථාපනය කිරීම

මෙම ව්‍යාපෘතිය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ව්‍යාපෘතියක් වන අතර, නව අමාත්‍යාංශ බෙදීමේදී අප අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. කිරි නිෂ්පාදනය සඳහා ඉහළ විභවයක් පවතින දිවයිනේ තෝරාගත් ප්‍රදේශයන්හි මධ්‍ය පරිමාණ කිරි සැකසුම් කර්මාන්තශාලා ස්ථාපනය කිරීම සහ අගය එකතු කරන ලද කිරි නිෂ්පාදන එම කර්මාන්තශාලාවන්හි නිපදවා එම ප්‍රදේශය තුළම අලෙවි කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. නිෂ්පාදන පිරිවැය අවම කොට පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට කිරි ආශ්‍රිත නිෂ්පාදන ලබා දීම තුළින් දේශීය පාරිභෝගිකයා දියර කිරි පරිභෝජනයට නැඹුරු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

නව රජයේ ප්‍රමුඛතා සහ ගොවි සංවිධානවල වර්තමාන අවශ්‍යතාවයන් අනුව මෙම ව්‍යාපෘතිය නැවත සැලසුම් කළ යුතුව ඇත. ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ පාර්ශව අතර සාකච්ඡා සිදුකරමින් පවතී.

## 9.11. වී මිලදී ගැනීමේ විශේෂිත වැඩ සටහන

2008 – 2015 දක්වා වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගත් වී තොග අතුරින් වැඩිම වී තොගය මිලදී ගත් වර්ෂය ලෙස 2015 වසර සඳහන්ය.

ඒ අනුව, වී අලෙවි මණ්ඩලය මඟින් නිර්දේශිත ප්‍රමිතියෙන් යුතුව කිලෝ ග්‍රෑම් 2000 ක උපරිම සීමාවක් යටතේ එක් ගොවියෙකුගෙන් වී මිලදී ගනිමින් රු.බිලියන 14.78 ක ආයෝජනයකින් යුතුව එම මණ්ඩලය විසින් මිලදී ගත් උපරිම වී තොගය වන මෙට්‍රික් ටොන් 323,636.27 ක වී තොගයක් 2015 වර්ෂයේ මිලදී ගැනීමට හැකිවීම එම ආයතනය ලද ජයග්‍රහණයකි.

## 9.12. විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලන ක්‍රමවේදයන් විධිමත් කිරීම

විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලන ක්‍රමවේදයන් විධිමත් කිරීම සඳහා පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීම, කාර්යය මණ්ඩල පරිපාටියක් සකස් කිරීම සියළුම ආර්ථික මධ්‍යස්ථාන සඳහා නව කළමනාකරණභාර සාමාජිකයින් පත් කිරීම එතෙක් කළමනාකරණ භාර නොපැවති රත්මලාන හා නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වෙනුවෙන් කළමනාකරණ භාර පිහිටුවීම හා ආර්ථික මධ්‍යස්ථාන වල නඩත්තු කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම ආදී කාර්යයන් සමූහයක් 2015 වර්ෂය තුළ සිදු කිරීමට හැකිවී ඇත.

# 10.විශේෂ ජයග්‍රහණ

## 10.1 ප්‍රතිපත්තිමය සාධනයන්

- **1958 අංක 29 දරණ සත්ත්ව පනත සංශෝධනය**

  සතුන්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීමට දැනටමත් පවත්නා නීති ක්‍රියාත්මක කිරීම, බල ගැන්වීම සඳහා පනත සංශෝධනය කිරීමට සංකල්ප පත්‍රයක් මත පදනම්ව අවශ්‍ය සංශෝධන සකස් කිරීමට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

- **සත්ත්ව සුභසාධනය සම්බන්ධයෙන් නව කෙටුම්පතක් ඉදිරිපත් කිරීම**

  1907 වසරේ සම්පාදිත සත්ත්ව හිංසනය වැළැක්වීමේ ආඥා පනත කමිටුවක් මඟින් සංශෝධනය කර සත්ත්ව සුභසාධන පනත් කෙටුම්පතක් ලෙස සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.